A

**නිවේදනය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරන ලද "සේවකයන්ගේ අයවැය සහන දීමනාව" සහ "සේවකයන්ගේ ජාතික අවම වේතනය" නමැති පනත් කෙටුම්පත් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව මෙම සභාවට දැනුම්දීමට කැමැත්තෙමි.

පෙත්සම්කරුවන් තම සංගමයේ සාමාජිකයන්ගෙන් 3/4 ක් ශ්‍රී ලාංකික පුරවැසියන් බව තහවුරු කිරීමට අපොහොසත් වීම හේතු කොටගෙන පෙත්සම්කරුවන් යථා පරිදි අධිකරණ බලය අයැද නොමැති බැවින් ශ්‍රේෂ්ඨාධිකරණයට තවදුරටත් මෙම පෙත්සම් විධිමත්ව සලකා බැලීමට අධිකරණ බලයක් නොමැති බව තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.